## රංග භූමිය / වේදිකාව

**නිපුණතා මට්ටම 1.3. ෘ රංග භූමිය /වේදිකාව**

- නාට්‍ය රඟ දක්වන ස්ථානය රංග භූමිය /වේදිකාව ලෙසින් දැක්විය හැකිය.
- ඕනෑම රංගයක් ඉදිරිපත් කිරීම සඳහා භාවිත වන තැනට රංග භූමිය යන වදන භාවිත කරයි.
- ප්‍රේක්ෂකයන්ට (නරඹන්නන්ට) වඩාත් හොඳින් නැරඹිය හැකි ස්ථානයක් ද රංගභූමිය වේදිකාව ලෙසින් හඳුන්වයි.
- රංග භූමි වර්ග කිහිපයක් දක්නට ලැබේ.

**ලංකාවේ දක්නට ලැබෙන රංගභූමි කිහිපයක්**



ටවර් හෝල් රඟහල



ලයනල් වෙන්ට්ඩ් රඟහල



නෙළුම් පොකුණ රඟහල



නාමෙල් මාලිනි පුංචි තියටර්

ඉහළ වේදිකාව

| | | | |
|---|---|---|---|
| ඉහළ දකුණ | ඉහළ මැද | ඉහළ වම | |
| මැද දකුණ | මැද | මැද වම | මැද වේදිකාව |
| පහළ දකුණ | පහළ මැද | පහළ වම | |

පහළ වේදිකාව

වේදිකාව මත සිටින රංග ශිල්පියකු ප්‍රේක්ෂකාගාරය දෙසට මුහුණලා සිටින විට ඔහුගේ දකුණු පස සහ වම් පස ලෙස සලකා මෙම කල්පිත භූගෝලීය කලාප හඳුන්වා ඇත. ප්‍රේක්ෂකාගාරයට ආසන්නයෙන් ඇති කොටස පහළ වේදිකාව ලෙස ද, ප්‍රේක්ෂකාගාරයට ඈතින් පිහිටි කොටස ඉහළ වේදිකාව ලෙස ද එම ස්ථාන දෙක අතර ප්‍රදේශය මැද වේදිකාව ලෙස ද හඳුන්වයි. සොකරි සහ කෝලම් වැනි ගැමි නාටකයන්හි ප්‍රේක්ෂකයන් වටේට සිටිමින් නාට්‍ය නැරඹූ අතර, ප්‍රොසීනියම් වේදිකාව එක් පසෙකට පමණක්, එනම් වේදිකාව ඉදිරියෙන් පමණක් පිහිටා ඇත.